ශාපයට ලක්වන කරුණු දෙකක් පිළිබඳ නුඹලා බියවනු. ඔවුහු: “අල්ලාහ්ගේ දූතයාණනි! ශාපයට ලක්වන කරුණු දෙක මොනවාද?” යැයි විමසුවෝය. එතුමා: “ජනයාගේ මාර්ගයේ හෝ ඔවුන්ගේ හෙවණෙහි වැසිකිලි කැසිකිලි යාම” යැයි පැවසූහ.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “ශාපයට ලක්වන කරුණු දෙකක් පිළිබඳ නුඹලා බියවනු. ඔවුහු: “අල්ලාහ්ගේ
දූතයාණනි! ශාපයට ලක්වන කරුණු දෙක මොනවාද?” යැයි විමසුවෝය. එතුමා: “ජනයාගේ
මාර්ගයේ හෝ ඔවුන්ගේ හෙවණෙහි වැසිකිලි කැසිකිලි යාම” යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

ශාපය ඇයැද සිටින මිනිසුන්ගේ ශාපය නියම වන කරුණු දෙකකින් නුඹලා වැළකී සිටිනු. එනම් කවරෙකු ඒ දෙක සිදු කරන්නේ ද ඔහු සුපුරුදු ශාපයට භාජනය වන්නේය. ඉන් අදහස් කරනුයේ මිනිසාගේ පුරුද්ද එවැනි කරුණකදී ශාප කිරීමය. එය ශාපයට ලක්වීමේ හේතුවකි. එය ඒ අයුරින්ම පිහිටි කල්හි එම කරුණු දෙක හේතුවෙන් ශාපය සේන්දු වනු ඇත. ඒ දෙක වනාහි මිනිසුන් යන එන මාර්ගයේ හෝ ඔවුන් හෙවණ ලබන ස්ථානයේ වැසිකිලි කැසිකිලි ඉටු කිරීමය. මෙය උත්තරීතර අල්ලාහ්ගේ ප්රකාශය හා සමානය. “අල්ලාහ් හැර දමා ඔවුන් ඇරයුම් කරන දෑට නුඹලා දොස් නොකියනු. එවිට කිසිදු දැනුමකින් තොරව සතුරුකමින් ඔවුන් අල්ලාහ්ට දොස් නගනු ඇත.” (අන්ආම්: 108) එනම් සැබැවින්ම අල්ලාහ්ට ඔවුන් දොස් නැගීමෙහිදී නුඹලා එයට හේතුවක් බවට පත්වන්නෙහුය. ඊට හේතුව නුඹලා ද ඔවුන්ගේ දෙවිවරුන්ට දොස් නගා ඇති බැවිණි. තවදුරටත් මිනිසෙකු තම පියාට හා මවට දෙස් නැගීමෙන් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් ද තහනම් කළේය. එවිට ඔවුහු: මිනිසෙකු ඔහුගේ දෙමාපියන්ට බැණ වදිනු ඇත්ද? යැයි විමසුවෝය. එතුමා: එසේය. මිනිසා තවත් මිනිසෙකුගේ පියාට බැණ වදියි. එහෙයින් ඔහු එම මිනිසාගේ පියාට බැණ වදියි. ඔහුගේ මවට බැණ වදියි.” එවිට තම පියාට බැණ වදින්නෙකු මෙන් ඔහු පත් වනු ඇත. එය ඔහු එයට හේතුවක් වූ බැවිණි. “ජනයාගේ මාර්ගයේ වැසිකිලි කැසිකිලි යාම” එනම්: ජනයා ගමන් කරන ජනයා මාර්ග ලෙස ගත් ස්ථානවල මළ මූත්රා කරමින් තම ස්වභාවික අවශ්යතාවන් සපුරා ගැනීමයි. ඔහු පදිංචිව සිටිය ද ගමනක නිරත වුව ද එහි ගරුත්වය එක හා සමානව පැවතීමෙහි කිසිදු සැකයක් නැත. සැබැවින්ම එහි ඔවුනට වේදනාවක් ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කළේය. “දේවත්වය විශ්වාස කරන්නන් හා විශ්වාස කරන්නියන්හට ඔවුන් ඉපැයූ දැයින් තොරව ඔවුනට වේදනා ගෙන දෙන්නෝ වෙති. සැබැවින්ම ඔවුන් බරපතල චෝදනාක් මෙන්ම පැහැදිලි පාපයක් උසුලා ගත්තෝය.” (අල් අහ්සාබ්: 58) එම මාර්ගය මිනිසා ගමන් නොයන ස්ථානයක් වී නම් තහනමට නියමිත හේතුව එහි නොමැති බැවින් ඔහුගේ අවශ්යතා එහිදී ඉටු කිරීමෙහි වරදක් නැති. “එසේ නැතහොත් ඔවුන්ගේ හෙවණෙහි හෝ” එනම් ජනයා ගොඩ බැස එහි වාඩි වී එය නැවතුම් ස්ථානයක් හා විවේකී ස්ථානයක් ලෙස ගත් හෙවණ ඇති ස්ථානවල තම වැසිකිලි කැසිකිලි අවශ්යතා ඉටු කිරීමය. ජනයා නොයන ඒ වෙත යොමු නොවන මිනිසුන්ගෙන් තොර වූ ස්ථානයක් වී නම් අදාළ හේතුකාරණාව නොමැති බැවින් එහි යට තම අවශ්යතා ඉටු කිරීමෙහි කිසිදු වරදක් නැත. හේතුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තල් ගසක් යට වාඩි වී තම අවශ්යතා ඉටු කළහ එහි හෙවණ තිබිණ.